wijeyanewspapers
Follow us on @lankadeepa www.facebook.com /lankadeepa subscribed :lankadeepa online www.lankadeepa.lk
අඛණ්ඩවම 16 වසරක් ජනප්‍රියතම මහජන සම්මානයෙන් පිදුම් ලද දිනපතා ජාතික පුවත්පත

# ලංකාදීප

★★★

32 වැනි කාණ්ඩය | 142 වැනි පත්‍රය | පිටු 12 යි | විජය ප්‍රකාශනයක් | 2023 පෙබරවාරි මස 22 වැනිදා බදාදා | මිල රුපියල් 60.00 යි

Marray

## කී හැටියට ඡන්දය තියන්න



කාදිනල්තුමෝ ජනපතිට කියති

5 පිටුව බලන්න

## ඡන්දය නිසා ගුරු මාරු කල්යයි

අභියාචනා සලකා බැලීම අරඹයි

# ඡන්දය දියවී! දියවී!

# මැතිසබේ ගාලගෝට්ටි

## ජවිපෙ - ද්‍රවිඩ සන්ධානය විරෝධතාවට නෑ

## විනාඩි 50 න් සභාව නවතී

■ සුජිත් හේවාජුලිගේ සහ අංජුල මහික වීරරත්න

පළාත් පාලන මැතිවරණය පවත්වන ලෙස බලකරමින් සමගි ජන බලවේගය සහ නිදහස ජනතා පෙරමුණේ මන්ත්‍රීවරුන් රැසක් සභා ගර්භය මැදට පැමිණ සටන් පාඨ කියමින් සහ විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් උද්ඝෝෂණයක නිරතවීම හේතුවෙන් පාර්ලිමේන්තුව ඊයේ (21) දැඩි උණුසුම්කාරී තත්වයක් ගත්තේය.

6 වැනි පිටුවට



## ඡන්දයට අයවැයෙන් වෙන්කළ මුදල් නොදුන්නාට පෙත්සමක්

## සජබ මහලේකම් ගොනුකරයි



■ මනෝප්‍රිය ගුණසේකර සහ රන්ජන් කටුගම්පොළ

පළාත් පාලන ඡන්දය පැවැත්වීම සඳහා 2023 වසරේ අයවැයෙන් වෙන් කළ මුදල් ප්‍රතිපාදන මැතිවරණ කොමිසමට නිකුත් නොකිරීමට මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා ගෙන ඇති තීරණයෙන් මහජනතාවගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන බවට තීන්දුවක් ලබා දෙන්නැයි ඉල්ලමින් සමගි ජන බලවේගයේ මහලේකම්වරයා ශ්‍රේෂ්ඨාධිකරණයට මූලික අයිතිවාසිකම් පෙත්සමක් ඊයේ (21) ඉදිරිපත් කළේය.

6 වැනි පිටුවට

## ඡන්දය කල්දැමීම: විපක්ෂය ඉල්ලූ විවාදය ආණ්ඩුව නොදෙයි

## ඡන්දයේ අර්බුදය ලොවට කියන්න

### නිදහස් ජනතා සන්ධානයෙන් තානාපතිවරුන්ට ලිපියක්

■ විමුක්ති එස්. රුද්‍රිගු

පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් ඇති වී තිබෙන අර්බුදකාරී තත්වය පිළිබඳව ජනතා නියෝජිතයන් ලෙස දැඩි කනස්සල්ලට පත්ව සිටින බැවින් ඒ පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කරන ලෙස ඉල්ලමින් නිදහස් ජනතා සන්ධානය ශ්‍රී ලංකාවේ සිටින විදේශීය තානාපතිවරුන් වෙත ලිපියක් යොමු කර ඇත.

6 වැනි පිටුවට

## විදුලිය ගාස්තු ඉහළ යෑමෙන් බේකරිවලට තදට වැදිලා: නිෂ්පාදන ඉල්ලුමත් බැහැලා



■ ශෂිකා අබේරත්න සහ මනීෂා වීරසිංහ

විදුලි ගාස්තු ඉහළ යාමත් සමග බේකරි නිෂ්පාදනවල මිල ඉහළ දැමීමෙන් ඒවායේ ඉල්ලුම සියයට 20කින් පමණ අඩුවී ඇති බව සමස්ත ලංකා බේකරි හිමියන්ගේ සංගමයේ සභාපති එන්. කේ. ජයවර්ධන මහතා පැවසීය.

විදුලි බිල සියයට 66කින් ඉහළ දැමීම අනෙක් ක්ෂේත්‍රයන්ට මෙන්ම බේකරි හිමියන්ටද තදින්ම බලපෑම් එල්ල කර ඇති බව ඔහු කීවේය.

6 වැනි පිටුවට

## හොර හරක් දෙදෙනාගෙන් එකෙක් පොලිස් සැරයන්ගේ වත්තේ

5 පිටුව බලන්න

## රජයේ ගෙවීම් භාණ්ඩාගාර බැඳුම්කර මගින්

## මඩ පොහොර නැව 20 ට පෙර කොළඹට

5 පිටුව බලන්න

## මෙරටට ඉන්ධන ගේන්න සමාගම් 3 ක් තෝරාගෙන

කිව්.ආර් කේතය තව මාස 3 කින් අවසන්

5 පිටුව බලන්න

## හබරාදුව ප්‍රා.සභා රැස්වීමේ ගැටුමකින් පොහොට්ටු-ජවිපෙ මන්ත්‍රීවරු 2 ක් රෝහලේ

5 පිටුව බලන්න

## සජබ විරෝධතාවේදී ගල් පහර වැදී කොස්තාපල් දෙදෙනෙක් රෝහලේ

පණ්කජ රුවින්දගේ

### සරදම්



සාගරත් මැතිසබේ ඡන්දෙ ඉල්ලලා උද්ඝෝෂණ කරලලු!
ගරු රඟපෑම්ද?

## රටගිය බිරිය ඉල්ලා සැමියා දරු තිදෙනා විදෙස් කන්තෝරුවට ගෙනත් දාලා

5 පිටුව බලන්න

## බිල නොගෙව්වාට විදුලිය කපන්න ආ අය බියගැන්වූ සජබ අපේක්ෂක අත්අඩංගුවට

5 පිටුව බලන්න

## පහළොස් වියැති දැරිය එක්ක පවුල් කා බස්පොළේ දමා ගිහින්


### පෙම්වතා අත්අඩංගුවට

■ ශ්‍රීනාත් ප්‍රසන්න ජයසූරිය

කොළඹට නුදුරු ප්‍රදේශයක පදිංචි පහළොස් හැවිරිදි දැරියක වසර එක හමාරක පමණ කාලයක් තිස්සේ නිවසේ තබාගෙන අඹුසැමියන් ලෙස ජීවත් වී පසුව එම දැරිය කුලියාපිටිය බස් නැවතුම්පොළේ දමා ගිය ඇගේ පෙම්වතා බවට සැලකෙන තරුණයෙක් කුලියාපිටිය මූලස්ථාන පොලිසිය විසින් පෙරේදා (20) අත්අඩංගුවට ගනු ලැබීය.

6 වැනි පිටුවට







pressreader PRINTED AND DISTRIBUTED BY PRESSREADER PressReader.com +1 604 278 4604 COPYRIGHT AND PROTECTED BY APPLICABLE LAW

# ලුහුඬු දැන්වීම්




## විකිණීමට

**WP** KR-6910 ටොයොටා, 2010, මෝටර් රථය ඉහළම ඉල්ලුමට වැලිබල් ෆිනෑන්ස් PLC 310, ගාලු පාර, කොළඹ 03. ටෙලි: 0714542958 L1023565040-1

**WP** LJ-1020 ටොයොටා, 2004, ලොරි රථය ඉහළම ඉල්ලුමට වැලිබල් ෆිනෑන්ස් PLC 310, ගාලු පාර, කොළඹ 03. ටෙලි: 0714542958 L1023565039-1

## ඕනෑකර තිබේ

**ෆිනෑන්ස්** ඇරියස් සහ සීස්කල වාහන බේරා දෙන අතර මිලදී ගැනීම වාහන තබා මුදල් දීමද කරනු ලැබේ. JKR එන්ටර්ප්‍රයිස් 0714111267 L57515-1

## ත්‍රිරෝද රථ විකිණීමට

**WP** AAK-2936 පියාජියෝ, 2013, ත්‍රිරෝද රථය ඉහළම ඉල්ලුමට වැලිබල් ෆිනෑන්ස් PLC 310, ගාලු පාර, කොළඹ 03. ටෙලි: 0711210810 L1023565038-1

**WP** AAK-6976 බජාජ්, 2013, NC YO-8227 බජාජ්, 2011, WP AAX-8965 බජාජ්, 2015, ත්‍රිරෝද රථ ඉහළම ඉල්ලුමට වැලිබල් ෆිනෑන්ස් PLC 310, ගාලු පාර, කොළඹ 03. ටෙලි: 0711210810 L1023565037-1




## විකිණීමට

**පිළියන්දල** මොරටුව පාරේ ෆුඩ්සිටි ළඟ මීටර් 50 අඩි 15 පාර පර්චස් 8 කාමර 4 අංගසම්පූර්ණ ඉතාම ලාභයට, විධායකට, දෙස්තරවරයෙකුට ඉතාම සුදුසුයි. 0702-308773 L57540-1

**මීපෙන්** හයිලෙවල් එකට, පාදුක්ක නගරයට 8km, පිටකොටුව - ඉංගිරිය ප්‍රධාන බස් පාරට 400m, පදිංචියට හරි යන පර්චස් 10 ඉඩමම ලක්ෂ 17/- යි. 0714645467 L57545-1

**හොරණ** කොළඹ පාරේ කහතුඩුව හයිවේ පිවිසුමට කි.මී. 4 වැදගත් පරිසරයක පිහිටි Prime Land නිරවුල් ඔප්පු සහිත පර්. 10 ඉඩම (ජල සම්පාදන සැපයීම ඇත) විකිණීමට ලක්ෂ 52. 0773-500488, 0714-483956 L57462-1

## කුලියට/බද්දට

**කිරිවත්තුඩුව** අවට අංගසම්පූර්ණ නිවසක් කුලියට දීමට ඇත. T.P. 0788195110 L57549-1

## ව්‍යාපාරික ස්ථාන උවමනාය කුලියට/බද්දට

**සුළු** පරිමාණයේ කෑම කඩයක් කරගෙන යෑමට ඒ සඳහා උපකරණද නැවතීමේ පහසුකම්ද සහිත ස්ථානයක් අවශ්‍යයි. 0741440393 L57490-1




## කාර්යාලීය උපකරණ විකිණීමට

**රිසෝ** FR 3950 මැෂින් 3යි. කෑලිවලට ගත හැකි FR1, GR 1, චීනයෙන් ගෙන්වූ අමතර කොටස් වැඩිම ඉල්ලුමට. 0718033419 L57385-1

## ඇට සහ පැළ

**තේ** පැළ හාරදහස් කාණ්ඩයේ හෝ විසිහත වර්ගයේ 7500 මතුගමට සාම්පල් පැළ පෙන්විය යුතුය. 0774523723. L49594-4

# පුද්ගලික

## ඉදුම් හිටුම් තිබේ

**ඉන්දු** තේජා වැඩිහිටි නිවාසය සඳහා වැඩිහිටියන් බඳවා ගනු ලබයි. සුවපහසු ආරක්ෂාකාරී වටපිටාවක පිහිටා ඇත. ඉන්දු තේජා වැඩිහිටි නිවාසය 804/13 ජෝන් කිල්ස් නිවාස සංකීර්ණය තේවත්ත පාර රාගම. 070-4097745 L57523-1

**රජයේ** ලියාපදිංචි අප වැඩිහිටි නිවාසයට රෝගී නිරෝගී වැඩිහිටියන් බඳවා ගැනේ. තවද බාහිර කරදරවලින් තොර පාලිකාවක්ද අවශ්‍යයි. 0718-827089, 0778-703064 L57472-1

## නම් වෙනස් කිරීම

**අනුරාධපුර** දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 561 වනමල් උයන ග්‍රාම නිලධාරී තුලානේ පුදුක්කුලම, මරදන්කඩවල යන ස්ථිර ලිපිනයේ පදිංචි ඉන්ද්‍රා ඒකනායක වන මම මින් ඉදිරියට ඒකනායක මුදියන්සේලාගේ ඉන්ද්‍රා ඒකනායක යනුවෙන් භාවිතා කරන බවට ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි. L57393-1

**අම්පාර** (නාමල්ඔය) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹේතලාව ග්‍රාම නිලධාරී වසමේ 1/බී/155, නාමල්ඔය, කඳවුරු පෙදෙසේ පදිංචි, පිලානවිතානගේ චන්ද්‍රලතා වන මා හට, ගාල්ල හබරාදුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා නිකුත් කළ අංක 1094 උප්පැන්න සහතිකයේ පියාගේ තොරතුරු තීරුවේ කිසිවක් සඳහන්ව නැතත්, මාගේ පියා වන පිලානවිතානගේ සාරිස් අප්පුහාමි යන අයගේ වාසගම භාවිත කරමි. 1980 දී මා වෙත නිකුත් කර ඇති ජා.හැ. 587461480V අවශ්‍ය කටයුතුවලදී භාවිත කරමි. එදා සිට අද දක්වාත්, ඉදිරියටත්, පිලානවිතානගේ චන්ද්‍රලතා යනුවෙන් භාවිත කරන බව සියලු දෙනාට දන්වමි. L57427-1

**කළුතර** බණ්ඩාරගම 678/C පදිංචි පොන්සේකාගේ ඍදණවති යන නම වෙනුවට ගම්පලගේ ඍදණවති පොන්සේකා යන නම භාවිතා කරන බවට ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටත් ශ්‍රී ලංකා ජනරජයටත් මෙයින් දැනුම් දෙමි. L57378-1

**කුරුණෑගල** දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 903 පොතුහැර බටහිර ග්‍රාම නිලධාරී වසමේ පදිංචි මොහමඩ් ඉක්බාල් මොහමඩ් ඉර්ෂාට් වන මා මෙතැන් පටන් ගුණමුණි නිමේෂ් ඉවෝන් සිල්වා යන නාමය භාවිතා කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියළුම මහජනතාවටත් ගෞරවයෙන් මෙයින් දැනුම් දෙමි. L57456-1

**කුරුණෑගල** දිස්ත්‍රික්කයේ බමුණාකොටුව ප්‍රා. ලේකම් කොට්ඨාශයේ කැඩපත්වෙහෙර ග්‍රාමසේවා වසමේ කැඩපත්වෙහෙර පදිංචි හපුවාදුරයලාගේ ඉෂාන් මධුරංග ගුණසේකර වන මම මින් ඉදිරියට දිවාකර මොහොට්ටිලාගේ ඉෂාන් මධුරංග ගුණසේකර යනුවෙන් ...

## සඳුදා නිල ප්‍රතිඵල — 2023.02.20

ජාතික ලොතරැයි මණ්ඩලය — National Lotteries Board — www.nlb.lk

| ලොතරැයිය | දිනුම් වාරය | මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය | ජයග්‍රාහී අක්ෂරය / ලග්නය | ජයග්‍රාහී අංක |
|---|---|---|---|---|
| මහජන සම්පත | 5037 | රු. 36,046,063.00 | D | 8 8 0 5 5 0 |
| ධන නිධානය | 1067 | රු. 84,371,694.80 | R | 29 40 48 65 |
| ජාතික සම්පත | 1492 | රු. 11,048,983.20 | තුලා | 3 8 3 9 9 0 |
| හඳහන | 346 | රු. 2,604,711.20 | සිංහ (විශේෂිත ලග්නය: සිංහ) | 04 31 40 56 |
| ගොවිසෙත | 3279 | රු. 80,285,568.80 | T | 31 38 40 47 |
| මෙගා පවර් | 1385 | Rs. 302,104,534.00 (මීළඟ පවර් සුපිරි ත්‍යාගය රු. 10,000,000.00; රු. 10,000,000.00) | J (සුපිරි අංකය 11) | 12 21 58 70 |

ඔබ ආශා කරන ඔබ සැමවිට දේ ඉෂ්ට සිද්ධ කරදී ඔබගේ ජීවිතය යහපත් කරදීම මගේ අරමුණයි.
ලොවම මවිත කළ සත්‍ය අන්දුට වශී ගුරුකම්
ආදරය පහස මැද සැනසුම් ලැබූ ඔබ අඩමින් ලතවෙමින් ජීවිතයම එපා වී සෝ සුසුම් හෙලන්නේද ඔබේ පෙම්වතා හෝ පෙම්වතිය, සැමියා හෝ බිරිඳ අනියම් ඇසුරක පැටලී ඇති නිසා කරකියා ගත හැකි දෙයක් නොමැතිව ඔබ හැඬු කඳුලින් දිවි ගෙවන්නේද?
උපේකා ගුරුමණියෝ 074-2339693 072-7867590

අතිප්‍රබල වශී ගුරුකම්
උපාලි තිලකරත්න ගුරුතුමා 077-6350087

රොඩී රැහේ අති ප්‍රබල වශී ගුරුකම්
S.W. ජයවර්ධන 077-6664657

ලංකාදීප

04 | 2023 පෙබරවාරි මස 22 වැනිදා බදාදා

කර්තෘ මණ්ඩලය : 2448321, 2423919, 5383237
ෆැක්ස් : 2438039, 2479240, 5383240
බෙදාහැරීම් : 2479625
ෆැක්ස් : 2479650
දැන්වීම් : 2479540, 5383383, 5330330,
ෆැක්ස් : 2314864, 2479595

wijeyanewspapers
helping shape opinions

අන්තර්ජාලයේ
ප්‍රථම සිංහල පුවත්පත

- වෙබ් අඩවිය -
www.lankadeepa.lk


# ගොවීන්ට මුදල් දීම පමා කළ නිලධාරීන්ට දඬුවම් නැද්ද?

ගොවීන්ගේ ගිණුම්වලට බැර කිරීමට නියමිත වූ රුපියල් කෝටි එකසිය තිහක් ඔවුන්ගේ ගිණුම් අංක වැරදියට සටහන් කිරීම නිසා නියමිත වේලාවට ගොවීන්ට ලබාදීමට නොහැකි වූ බව සඳහන් පුවතක් "ගොවි සල්ලි පමා කිරීම පක්ෂ දෙකක හවුල් දේශපාලන ගේමක්" යන හිසින් නොබෝද අප පුවත්පතේ පළ වූයේය. ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලැබුණු කෝටි 800ක මුදල ගොවීන්ගේ ගිණුම් වෙත බැර කිරීමේ දී මෙම ප්‍රමාදය සිදු වූ බව ද එම පුවතේ සඳහන් විය.

මීට අමතරව , "නිතාමතා ගොවි ගිණුම් අංක වැරැද්දූ නිලධාරීන්ට එරෙහිව දැඩි විනය පියවර ගැනීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව තීරණය කරයි " යන හිසින් යුතුව කෘෂිකර්ම අමාත්‍යාංශය නිකුත් කළ කෘෂි පුවත් නිවේදනයක සඳහන් වන්නේ මේ සම්බන්ධයෙන් ඇතැම් ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරීන්ට එරෙහිව දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව තීරණය කර ඇති බවකි. ඇමැතිවරයා කියන ආකාරයට ඉහත සඳහන් නිලධාරීන් මෙකී වරද දේශපාලන පක්ෂ දෙකක බලපෑම් මත සිදු කර ඇත්තේ ද යන්න මෙතෙක් නිසි විමර්ශනයකින් සනාථ වී නැත. රාජ්‍ය සේවකයන් දේශපාලනය කරන්නේ නම් රාජ්‍ය සේවයෙන් ඉවත්ව ගොස් දේශපාලනය කළ හැකි බව අමාත්‍යවරයා කී බව එම පුවත් ලිපියේම සඳහන් වෙයි.

විශේෂයෙන් ගොවිජන සේවා (මේ වනවිට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව) දෙපාර්තමේන්තුවට දේශපාලනය රිංගා ගැනීම සම්බන්ධයෙන් පළමු කොටම වගකිව යුත්තෝ දේශපාලකයෝමය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉතිහාසය තුළ අවස්ථා දෙකකදී දැවැන්ත සේවක පිරිසකට දේශපාලන පත්වීම් ලබා දී ඇත. පළමුකොටම 1979 අංක 58 දරන ගොවිජන සේවා පනතට අදල වගා නිලධාරීන් පත්කිරීමේ දී එම කාරණය සිදු වූයේ දේශපාලන පදනමක පිහිටා ය. එවකට පැවති ග්‍රාම නිලධාරි වසම් තුනකට පමණ එක් අයකු බැගින් වගා නිලධාරීන් පත් කිරීම සිදු කෙරිණි. ඉන් අනතුරුව 1994 දී පොදු පෙරමුණු රජය බලයට පත්වීමෙන් පසුව 1995දී ගොවි සෙවණ නියාමකවරුන් පත් කරන ලදී. දළ වශයෙන් එක් ග්‍රාම නිලධාරී වසමකට එක් අයකු බැගින් පත් කරන ලද ගොවි සෙවණ නියාමකවරුන්ගේ නිල නාමය පසුව කෘෂි පර් යේෂණ හා නිෂ්පාදන සහකාර හෙවත් කෘපනිස යනුවෙන් වෙනස් විය. සංඛ්‍යාව අතින් දෙලොස් දහසකට වැඩි පිරිසක් එසේ පත් කරන ලද්දේ දැඩි දේශපාලන පදනමක පිහිටාය. ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් පවා එවකට සලකා නොබැලූ අතර ඔවුන් මැතිවරණ බල ප්‍රදේශ මට්ටමින් තෝරා ගැනුණේ බලයේ සිටි දේශපාලන පක්ෂයේ සංවිධායකවරුන් සහ මන්ත්‍රීවරුන් විසිනි. පිටකොටුව වැනි අතිශය නාගරික ප්‍රදේශවලට පවා ගොවි සෙවණ නියාමක නිලධාරීහු පත් කරනු ලැබූහ. තම පාක්ෂිකයන්ගේ දරුවන් එම තනතුරුවලට පත් කරන ලද බව එවකට සිටි අමාත්‍යවරයා ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළ අවස්ථා බොහෝය. එයින් නොනැවතී එම නිලධාරීන් රටේ මැති ඇමතිවරුන්ගේ දේශපාලන කටයුතුවලට ප්‍රසිද්ධියේම හවුල් කර ගැනීම ද සිදු වූයේය. නිර්මලව පැවති ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දේශපාලනීකරණයට භාජන වූයේ දේශපාලකයන් ගේම වරද නිසාය.

ගොවීන් ලක්ෂ දෙළහකගෙන් සීයට 38ක ගිණුම් අංක (එසේ ගණන් බැලූ විට සහනාධාර ප්‍රමාද වූ ගොවීන් සංඛ්‍යාව 456000කි) වැරදී ගොස්, මුදල් ආපසු ලැබී ඇති බව අමාත්‍යාංශයේ පුවත් ලිපියේ සඳහන් වේ. මෙතරම් අඛණ්ඩ සම්බන්ධීකරණ ජාල රටාවක් පවතින දෙපාර්තමේන්තුවකට මේසා වරදක් සිදුවීම අතිශය කනගාටුදායකය.

මේ වන විට රටේ ජනගහනයෙන් සියයට හැට අටක් පමණ දෙනා ආහාර අහේනියෙන් පීඩා විඳින බව ලෝක ආහාර සංවිධානය අනුග්‍රහයෙන් නොබෝද කළ සමීක්ෂණයකින් හෙළිදරව් විය. එයින් ද වැඩිපුරම පීඩා විඳින්නේ ග්‍රාමීය මට්ටමේ ජනයා බව තවදුරටත් අනාවරණය විය.

එවැනි අවස්ථාවක ගොවීන්ගේ ආර්ථික අපහසුතා මඟ හැරීමට නිසි වෙලාවට ඔවුන් අතට පත්විය යුතු මුදල් ගිණුම් අංක වැරදී යාම නිසා ඔවුන් අතට නොලැබීම මහත් වරදකි. මිල අධික යෙදවුම් උදෙසා ගොවීන් බොහෝ විට වියදම් දරන්නේ අවිධිමත් මූලාශ්‍රවලින් ගත් ණය වලිනි. ඒ අධික පොලිය යටතේය. බොහෝ විට ඔවුහු ඒ සඳහා කනකර උකස් තබති. මේ වන විට රට තුළ සැලකිය යුතු මට්ටමින් අන්තර්ජාලය ඔස්සේ තොරතුරු හුවමාරු කර ගැනීමේ පහසුකම් පවතිද්දී අංක වැරදීමකින් ගොවීන්ගේ සහනාධාර මුදල් නොලැබී යාම සම්බන්ධයෙන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවත් කෘෂිකර්ම අමාත්‍යාංශයත් පොදු ජනතාවට වගකිව යුතුය.

කාලීන සටහන

# අද අවශ්‍ය ඡන්දයද? ආර්ථිකයද?

**විදේශ ණය ගෙවීමට නොහැකිව බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කිරීම රටකට මුහුණ දීමට සිදුවන ඉතා අවාසනාවන්ත සහ විශේෂිත තත්ත්වයකි. එවැනි තත්ත්වයක් හැමදාම පවතිනු ඇතැයි අපේක්ෂා කළ නොහැකිය. එවැනි විශේෂ හේතු නොමැතිව වුව ද පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ කල් දමා ඇති රටක මුදල් ලබා නොදීම මගින් අනෙකුත් මැතිවරණ වුව ද කල්දැමිය හැකියැයි ප්‍රකාශ කිරීම කොතරම් දුරකට තාර්කික ද යන්න විමසා බැලිය යුතුව ඇත.**

මාර්තු මස 9 වැනිද පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රාදේශීය සභා සහ නගර සභා ඡන්දය එදිනට පැවැත්වීමට නොහැකි වී ඇති බව මැතිවරණ කොමිසම විසින් සඳහන් කර ඇතැයි මාධ්‍ය විසින් වාර්තා කර තිබුණි. මීට පෙර පැවති අවසන් මැතිවරණය වූ 2020 පාර්ලිමේන්තු මැතිවරණය පිළිබඳ සිදුවීම් මගේ මතකයට නැගේ. එම වසරේ මාර්තු මස 19 වැනි දින නාමයෝජනා භාර ගෙන අප්‍රේල් මස 25 වැනි දින මැතිවරණය පවත්වන බව මැතිවරණ කොමිසම ඊට පෙර නිවේදනය කළේය. ඒ අනුව මාර්තු මස 19 වැනි දින දවල් 12ට නාම යෝජනා භාර ගැනීම අවසන් විය. මැතිවරණ කොමිසම එදින මැතිවරණ දිනය පිළිබඳ කළ ප්‍රකාශයෙන් රටේ සියලු දෙනා විශ්මයට පත් වූයේ යැයි සිතමි. කොමිසම නිවේදනය කළේ කෝවිඩ් වසංගතය හේතුවෙන් මහ මැතිවරණය අප්‍රේල් මස 25 වැනි දින පැවැත්වීමට නොහැකි බවත් එය දින නියමයක් නොමැතිව කල් තබන බවත්ය.

රටේ ව්‍යවස්ථාදායකය වන්නේ පාර්ලිමේන්තුවයි. රජයේ මුදල් පිළිබඳව පාලනය සහ වගකීම පැවරී ඇත්තේ ද පාර්ලිමේන්තුවටය. පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සහ අලුතින් පාර්ලිමේන්තුව රැස්විය යුතු දිනය පිළිබඳව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව සඳහන් වී ඇත. එහෙත් පාර්ලිමේන්තු මැතිවරණයක් කල් දැමිය හැකි ආකාරයක් පිළිබඳව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ කිසිවක් සඳහන් නොවේ. පාර්ලිමේන්තුව විසිරුවා හළ විට රටේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය අක්‍රිය වන අතර පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමූ විට රටේ නීති පැනවීමේ ක්‍රියාවලිය අඩපණ වේ. එසේ වුවද එම අවස්ථාවේ මැතිවරණ කොමිසම මැතිවරණය කල් තැබීමට තීරණය කළේය. විපක්ෂය ඉල්ලා සිටියේ මැතිවරණය කල් තබන ලෙසයි. ඒ නිසා අද මෙන් උද්ඝෝෂණ පැවැත් වූයේ නැත. කිසිවෙක් පාරට බැස්සේ ද නැත.

ඉන් පසු මැතිවරණ කොමිසම අප්‍රේල් 25 වැනිද පැවැත්වීමට නියමිතව තිබූ මැතිවරණය ජූනි මස 20 වැනි දින පවත්වන බව නිවේදනය කළේය. එහෙත් ජූනි මස 10 වැනි දින නැවතත් නිවේදනය කළේ ජූනි මස 20 වැනි දින මැතිවරණය නොපැවැත්වෙන බවත් එය අගෝස්තු මස 05 වැනි දින පැවැත්වෙන බවත්ය. අප්‍රේල් මස 25 වන දින පැවැත්වීමට දින නියම කර තිබූ මැතිවරණය අගෝස්තු මස 05 වැනි දින දක්වා මාස තුනකුත් දින 10කින් කල් දමනු ලැබුයේ කෝවිඩ් වසංගතය හේතුවෙන් මැතිවරණය පැවැත්වීමට නොහැකි බව ප්‍රකාශ කරමිනි.

## රට මූණ දෙන විශේෂිත තත්ත්වය

රටේ ව්‍යවස්ථාදායකය ක්‍රියාත්මක නොවන බැවින් එක්තරා ආකාරයකින් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක නොවූ අරාජික කාල පරිච්ඡේදයකට රට ඇද වැටුණ ද රටේ පැවති විශාල අර්බුදය හමුවේ එවැනි පියවරක් මැතිවරණ කොමිසම විසින් අනුගමනය කළා විය හැකිය.

කෝවිඩ් අර්බුදයෙන් පසු, ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් අනතුරුව ඇති වූ දරුණුම අර්බුදයට දැන් මුහුණ දෙමින් සිටී. ආර්ථික අර්බුදය හේතුවෙන් විදේශවලින් ලබාගෙන ඇති ණය ආපසු ගෙවීම අත්හිටුවන බව රජය විසින් නිල වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එය සැලකෙන්නේ එක්තරා ආකාරයකට රට බංකොලොත්භාවය ප්‍රකාශ කිරීමක් වශයෙනි. රජය සඳහන් කරන්නේ දැනට රජයට ලැබෙන ආදායම යොදවනු ලබන්නේ වැටුප් ගෙවීම, විශ්‍රාම වැටුප් ගෙවීම, සමෘද්ධි ප්‍රතිලාභ ගෙවීම සහ අනෙකුත් සුබසාධන කටයුතු සඳහා පමණක් බවයි. එම කටයුතු පවත්වාගෙන යෑමට වුවද ලැබෙන ආදයම ප්‍රමාණවත් නැත. එනිසා මැතිවරණයට අවශ්‍ය වියදම් ලබාදීමට හැකියාවක් නොමැති බව රජය විසින් මැතිවරණ කොමිසමට දන්වා ඇත.




මැතිවරණ මගින් ව්‍යවස්ථාදායකයට තම නියෝජිතයන් තෝරා පත් කර ගැනීම මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතියකි. එම අයිතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලැබෙන ප්‍රධානතම අවස්ථාවක් වන්නේ පාර්ලිමේන්තු මහ මැතිවරණයයි. රටක ඇති වන විශේෂිත තත්ත්වය හේතුවෙන් පාර්ලිමේන්තු මහ මැතිවරණය වුවද කල්තැබීමට සිදු වන බව 2020 පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමට සිදුවීම මගින් පැහැදිලි වේ. වරින් වර රජය විසින් ශ්‍රී ලංකාවේ පළාත් පාලන මැතිවරණය කල් තබා ඇති බව ඒ පිළිබඳ ඉතිහාසය පිරික්සන විට පැහැදිලි වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 සංශෝධනය මගින් ප්‍රතිෂ්ඨාපනය කරන ලද පළාත් සභා මැතිවරණය කල් තබා දැනට වසර 05කට ආසන්න කාලයක් ගත වී ඇත. එසේ වුවද ඒ පිළිබඳව කිසිවකුගේ අවධානය යොමු වී ඇති බවක් පෙනෙන්නට නැත. පළාත් පාලන ආයතන මැතිවරණය කල් තැබීම මගින් මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අහිමි වන බව ප්‍රකාශ කරන්නේ නම් එය පළාත් සභා වැනි ආයතනවලට ද අදළ විය යුතුය. පළාත් සභා මැතිවරණය කල් තැබීමට අදළ විධි විධාන පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගැනීමට අද පළාත් පාලන ආයතන මැතිවරණය කල් තැබීමට එරෙහි වන බොහෝ පක්ෂවල සහාය ලැබුණු බව මහජනතාවට අමතක වී නැතැයි සිතමි.

මැතිවරණ වියදම් සඳහා මුදල් ලබා දීමට නොහැකි වීම හේතුවෙන් පළාත් පාලන මැතිවරණය කල් දැමූවහොත් ඉන් පසු ඒ හේතුව මතම පාර්ලිමේන්තු මැතිවරණ හෝ ජනාධිපතිවරණ වුව ද කල් දැමීමට ඉඩ ඇතැයි ඇතැම් අය විසින් ප්‍රකාශ කර ඇති බව මාධ්‍යවල වාර්තා විය. කොරෝනාව ශ්‍රී ලංකාව මෙන්ම අනෙකුත් රටවල් ද මුහුණ දුන් විශේෂිත තත්ත්වයක් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මහ මැතිවරණය කල් දැමීමක් පිළිබඳව සඳහන් නොවූව ද පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය කල් තැබීමට මැතිවරණ කොමිසමට සිදු විය. විදේශ ණය ගෙවීමට නොහැකිව බංකොලොත්භාවය ප්‍රකාශයට පත් කිරීම රටකට මුහුණ දීමට සිදුවන ඉතා අවාසනාවන්ත සහ විශේෂිත තත්ත්වයකි. එවැනි තත්ත්වයක් හැමදම පවතිනු ඇතැයි අපේක්ෂා කළ නොහැකිය. එවැනි විශේෂ හේතු නොමැතිව වුව ද පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ කල් දමා ඇති රටක මුදල් ලබා නොදීම මගින් අනෙකුත් මැතිවරණ වුව ද කල්දැමිය හැකියැයි ප්‍රකාශ කිරීම කොතරම් දුරකට තාර්කික ද යන්න විමසා බැලිය යුතුව ඇත.

රට ආර්ථික බංකොලොත්භාවයෙන් මුදගෙන අඩුම තරමින් රටේ ජනතාවගේ එදිනෙද ජීවිතය යථා තත්ත්වයට පත් කර ගත හැකි වන තුරු ආර්ථික කටයුතු සඳහා ප්‍රමුඛතාවක් ලබා නොදීම කනගාටුවට කරුණකි. රටේ ජනතාවට කිසියම් ආකාරයක අස්වැසිල්ලක් ලැබිය හැකි ආකාරයට ආර්ථික කටයුතුවල ප්‍රගතියක් අත්කර ගැනීමට සමහර ආර්ථික අංශවලට හැකියාව ලැබී ඇත. රටට පැමිණෙන සංචාරකයන්ගේ ප්‍රමාණය දිනෙන් දින ඉහළ යයි. රටට එවන විදේශ ප්‍රේෂණ ප්‍රමාණය පසුගිය මාස කිහිපය තිස්සේම වර්ධනය වී ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රථම ණය වාරිකය ලබන මස නිකුත් කිරීමට හැකිවන ආකාරයේ පරිසරයක් නිර්මාණය වෙමින් පවතී. ප්‍රධාන ණය පාර්ශ්වකරුවකු වන චීනය කවර ස්ථාවරයක් දරුවද එය නොතකා හැර ණය ලබා දීම පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කටයුතු කරමින් සිටින බව වාර්තා විය.

## සහන කපා ඡන්දය පැවැත්වීම

ඒ අතරම විටින් විට වෙනස්වන ආර්ථික තත්ත්වයන්ට අනුකූලව ඒවාට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාව ද බැහැර කළ නොහැකිය. මහ කන්නයේ වී අස්වැන්න දැන් ලැබෙමින් පවතී. මෙවර වාර්තාගත අස්වැන්නක් ලැබෙනු ඇතැයි ද බොහෝ කලකට පසු මෙවර රටේ සහල් අතිරික්තයක් ඇතිවේ යැයි ද අපේක්ෂා කෙරේ. එහෙත් අස්වනු නෙළීමට පටන් ගැනීමත් සමග වී මිල රුපියල් 60 දක්වා පහළ වැටී ඇතැයි ගොවීන්ගෙන් පැමිණිලි ලැබුණු විට රජය රුපියල් සියයක සහතික මිලකට වී මිලදී ගැනීමට කටයුතු යෙදුවේය. ආදායම අහිමි වීම නිසා දැඩි පීඩනයකට ලක්ව ඇති අඩු ආදායම්ලාභී පවුල්වලට රජය විසින් මිලදී ගන්නා සහල් වලින් කොටසක් නොමිලේ ලබා දීමට කටයුතු කර තිබේ. වී මිලදී ගැනීම සඳහාත් අඩු ආදායම්ලාභී පවුල්වලට මසකට සහල් කිලෝ 10 බැගින් ලබා දීම සඳහාත් රුපියල් බිලියන 20ක් පමණ වැයවේ යැයි ඇස්තමේන්තු කර ඇත. අනෙකුත් වියදම් අඩු කරන අතර ආර්ථික අර්බුදය හේතුවෙන් පීඩාවට පත්ව ඇති අඩු ආදායම්ලාභී පවුල්වලට සෘජු ආධාර ලබාදීමේ අවශ්‍යතාව ජාත්‍යන්තර ආධාර ආයතන විසින් අවධාරණය කර ඇත. පළාත් පාලන මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය නම් රජයට වී සහතික මිල සඳහා ද දිළිඳු සහන සඳහා ද වෙන් කර ඇති මුදල ඒ සඳහා යෙදවීමට හැකි වේ.

විදුලි බිල වැඩි වීම, ආදායම් බදු වැඩි වීම ආදිය ආර්ථික අර්බුදය වෙනුවෙන් මහජනතාවට ගෙවීමට සිදුව ඇති වන්දිය වේ. මේ අවස්ථාවේ දී පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීම වෙනුවෙන් දැරීමට සිදුවන වියදමේ බර පැටවෙනු ඇත්තේ ද මහජනතාව මතය. පළාත් පාලන ආයතනවල සීමා නිර්ණය සඳහා පත් කර ඇති කොමිසමේ වාර්තාව ළඟදීම ලැබෙනු ඇත. රජය විසින් යෝජනා කර ඇති ආකාරයට එම ආයතනවල නියෝජිතයන්ගේ සංඛ්‍යාව අඩකින් අඩු කිරීමට හැකි වේ. ඔවුන් සඳහා දරන වියදම ද අඩකින් අඩු කිරීමට අවස්ථාව සැලසේ. ඒ සඳහා ද ඉඩ ලැබෙන ආකාරයට කෙටි කලකට මැතිවරණය කල්දැමිය හැකි නිශ්චිත කාලසීමාවක් පිළිබඳව එකඟතාවකට ඒම හෝ 2020 මහ මැතිවරණයේදී සිදු කළාක් මෙන් රටට බරක් නොවන ආකාරයට මැතිවරණය පැවැත්වීම සඳහා මැතිවරණ දිනය වෙනස් කිරීම පිළිබඳව තීන්දුවකට ඒමට ද මැතිවරණ කොමිසමට හැකි වනු ඇත.



කැලණිය විශ්වවිද්‍යාලයේ
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ
හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය
**සුනන්ද මද්දුමබණ්ඩාර**

| පෝය ලබන ගෙවෙන වේලාවන් | | | |
|---|---|---|---|
| දිනය | පෝය | පෝය ලබන වේලාව | පෝය ගෙවෙන වේලාව |
| පෙබ: 27 | පුර අටවක | පෙ.ව.01.04 | 28දා පෙ.ව.02.25 |
| මාර්: 06 | පසළොස්වක | ප.ව.04.17 | 07දා ප.ව.06.09 |
| මාර්: 14 | අව අටවක | ප.ව.08.20 | 15දා ප.ව.06.43 |
| මාර්: 21 | අමාවක | පෙ.ව.01.50 | 21දා ප.ව.10.57 |



# බොල් කළ විදුලි බිල් නැවත අය කරගනිමු

රුපියල් කෝටි 200ක් පමණ අයවිය යුතුව තිබූ විදුලි බිල් බොල් ණය ලෙස කපා හැර ඇති බවට ඉකුත් 08 වැනිද ලංකාදීප පුවත්පතේ පළවිය. තවත් රුපියල් කෝටි 400ක් පමණ අය කරගත යුතුව ඇති බව එකී පුවත්පතේ සඳහන්.

සැබවින්ම බොල් ණය ලෙස මෙලෙස කපාහල හැකිද? ප්‍රවෘත්තිය ප්‍රකාර මේ බොල් ණය දේශපාලකයන්ගේ හා මහා පරිමාණ ව්‍යාපාරිකයන්ගේය. මෙම දෙපක්ෂය බිල් ගෙවීමට නොහැකි අඩු ආදායම්ලාභීන් නොවේ. මෙම මුදල් අවසාන සතය දක්වා අය කර ගැනීම විදුලි බල මණ්ඩලයේ පරම වගකීම වේ. ණය මුදලක් හෝ අයවීමට ඇති බිලක් බොල් ණය ලෙස අත්හැර දැමීමට නම් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය ගත යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලයට බොල් ණය ලෙස කපා හැරීමට නිර්දේශ කරන්නේ සාමාන්‍යාධිකාරී සහ ඉහළ නිලධාරීන්ය.

මේ දෙපිරිසම එක්ව මහා පරිමාණ වංචාවකට මග පාද ඇත. මෙබඳු දේවල් සිදුවන්නේ කෙසේද කියා සාමාන්‍ය දැනීම ඇති ඕනෑම අයකුට තේරෙනවා ඇත. විදුලි බිල් බොල් ණය බවට හරවන්නට ඇත්තේ ක්ෂණිකව නොවේ. ඒ පිළිබඳව තොරතුරු හැදෑරීමට සිදුවන්නට ඇති බවට සැකයක් නැත. මෙකී මූලික අවධියේ වෘත්තීය සමිති ඇස් ඇර සිටියේ නම් ඒ අවස්ථාවේ මෙය හෙළිකොට අපරාධය අවම කරගත හැකිව තිබුණි.

බොල් ණය ලෙස විදුලි බිල් කපා හැරීම ගැන කිසිදු දේශපාලකයෙක් හෝ සංවිධානයක් ඒ අවධියේ විරුද්ධ වූ බවට සඳහන් නොවේ. සවුදම් ජේමාට දන් කද ලැබුණා සේ දේශපාලකයන් හා ඉහළ නිලධාරීන් ක්‍රියා කර ඇත.

මෙම මුදල අයකර ගැනීමට විදුලි විෂය භාර අමාත්‍යවරයාට අවංක අවශ්‍යතාවක් වෙතොත් ඔහු තොරතුරු හදුරා කැබිනට් මණ්ඩලයට පත්‍රිකාවක් මගින් වාර්තා කොට අනුමැතිය ලබාගත හැකිය. කැබිනට් මණ්ඩලය තීරණය කළහොත් ඒ අනුව කටයුතු කිරීමට විදුලි බල මණ්ඩලය බැඳී සිටී. හිඟ බිල්පත් ඇති දේශපාලකයන් හෝ ව්‍යාපාරිකයන් මියගොස් ඇත්නම් ඔවුන්ගේ පසු උරුමකරුවන් වගකිව යුතුය. එම අයගේ දේපල තහනමට ගැනීමට අධිකරණමය ක්‍රියාමාර්ග ගත හැකිය.

මහජන උපයෝගිතා කොමිසමට ද මෙහිලා විශේෂ වගකීමක් ඇත. විදුලිය කැපීමට එරෙහිව අධිකරණයට ගියා සේ විදුලි බිල් අයකර ගැනීමට ද අධිකරණයට යා හැකිය.

මෑතක සිට පුවත්පත්වල විවිධ වංචා දූෂණ ගැන තොරතුරු දිනපතා පළවේ. එහෙත් ඒවා පසුදින අමතක වී යන ස්‍රූපයකි ඇත්තේ.

මෙම මුදල් අන්තිම සතය දක්වා අයකර ගන්නා තෙක් අනෙක් මාධ්‍ය ද වරින්වර හඬ නැගිය යුතුය. විවිධ කරුණුවලට අධිකරණයට යන පොදුජන සංවිධාන ද මෙම කාරණයේ දී අධිකරණයට යා යුතුය. ඒ පිළිබඳ පුළුල් මහජන මතයක් ඇති කළ යුතුය.

**සිරිසෝම රූබසිංහ**
කිතුලම්පිටිය

**ඔබේ ප්‍රශ්නයත් වචන 250 කට සීමාවන පරිදි 'මහජන පැමිණිලි' දිනපතා ලංකාදීප කතා, අංක 08, හුණුපිටිය හරස් පාර, කොළඹ 02 යන ලිපිනයට අපට එවන්න**

| හදිසි දුරකතන ඇමැතුම් අංක | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පොලිස් මූලස්ථානය | 2421111 | පොලිස් හදිසි ඇමැතුම් | 2433333 | අල්ලස් කො.දෙ. | 1954 | යුද හමුදා මූලස්ථානය | 2432683 | බෝම්බ නිශ්ක්‍රීය අංශය | 2434251 | ගුවන් හමුදා මූලස්ථානය | 2441044 | |

pressreader PRINTED AND DISTRIBUTED BY PRESSREADER PressReader.com +1 604 278 4604 COPYRIGHT AND PROTECTED BY APPLICABLE LAW

# මිනීමැරුම් නඩුවක ප්‍රධාන සැකකරු හෙරොයින් එක්ක දැලේ

■ කරන්දෙණිය එම්. සුසිල් පියන්ත

**සංවිධානාත්මක අපරාධ කල්ලියක සාමාජිකයකු හෙරොයින් ග්‍රෑම් 8.110ක් සමග මීටියාගොඩ දී පෙරේදා 20 වැනිදා අත්අඩංගුවට ගත් බව පොලිස් විශේෂ කාර්ය බළකායේ ජයවර්ධනපුර කඳවුරේ විශේෂ වැටලීම් අංශය කියයි.**

සැකකරු බටපොළ සිට මීටියාගොඩ දක්වා යතුරු පැදියකින් යමින් සිටිය දී ඔහු ගමන්ගත් යතුරු පැදිය පරීක්ෂා කිරීමේ දී මෙම මත් කුඩු තොගය සොයා ගත් බව ද පොලීසිය කියයි.

සැකකරු මීට වසර කිහිපයකට උඩ දී අම්බලන්ගොඩ මාළු ව්‍යාපාරිකයකුගේ ඝාතනයේ ප්‍රධාන සැකකරුවකු බවත් ඔහු ඒ සම්බන්ධයෙන් රිමාන්ඩ් කර සිට ඇපමත නිදහස්ව සිටින්නකු බවත් පොලීසිය කියයි.

සැකකරු වැඩිදුර පරීක්ෂණ සඳහා මීටියාගොඩ පොලීසියට බාර දී ඇති අතර ඔහු ඊයේ (21වැනිදා) බලපිටිය අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව සිටියේය.

## "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනය සම්බන්ධව ගනු ලැබූ නියාමන ක්‍රියාමාර්ග සම්බන්ධව මහජනතාව වෙත කෙරෙන දැනුම්දීමයි

"ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනය වෙත මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා නිකුත් කර තිබූ බලපත්‍රය, 2022 දෙසැම්බර් 28 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය (මුදල් මණ්ඩලය) විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 37(3) වගන්තිය ප්‍රකාරව තීරණය කරන ලදී, ඒ අනුව "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයට 2022 දෙසැම්බර් 28 දින සිට මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන යටතේ, මුදල් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමට අවසර නොමැත.

තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින්, "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනය වෙත 2000 අංක 56 දරණ කල්බදු මූල්‍යකරණ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ලබා දී තිබූ ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කිරීමට තීරණය කර ඇත.

"බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්ම" සම්බන්ධයෙන් නිකුත් කල නියෝග වලට අනුකූලව එස්එම්බී ෆයිනෑන්ස් පීඑල්සී" (එවකට එස්එම්බී ලීසිං පීඑල්සී) ආයතනය විසින් "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ තැන්පතු නැවත ගෙවීම සඳහා දැක්වූ දායකත්වය මත "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ තවමත් හිමිකම් ලබානොගත් තැන්පතු වගකීම් "එස්එම්බී ෆයිනෑන්ස් පීඑල්සී" ආයතනය වෙත ඊට අනුරූපී වත්කම් සහ අදාළ තැන්පතුකරුවන්ගේ තොරතුරු සමඟ පවරනු ඇත.

තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය ඔස්සේ එහි පවතින රෙගුලාසීන්ට අනුකූලව එහි රක්ෂණය වී ඇති තැන්පතුකරුවන් විසින් තවමත් ලබා නොගත් රක්ෂණ වන්දි මුදල්, රු. 1,100,000/-ක උපරිමයකට යටත්ව ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නුදුරේදීම ගනු ඇත. "එස්එම්බී ෆයිනෑන්ස් පීඑල්සී" ආයතනය වෙත "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ තවමත් හිමිකම් ලබානොගත් තැන්පතු වගකීම් පැවරීමෙන් සහ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක ක්‍රමය ඔස්සේ පවතින රෙගුලාසීන්ට අනුකූලව තවමත් ලබා නොගත් ඉතිරි රක්ෂණ වන්දි මුදල් ගෙවීමෙන් පසු, "ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී" ආයතනයේ සමස්ත තැන්පතු වගකීම ශූන්‍ය වනු ඇත.

වැඩිදුර විමසීම් සඳහා:

| ආයතනය | අරමුණ | දුරකථන අංක | විද්‍යුත් ලිපිනය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව- බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව | බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධව විමසීම් සඳහා | 011 2477504 | snbfi_query@cbsl.lk |
| ශ්‍රී ලංකා මහ බැංකුව- නිරාකරණය හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුව | තැන්පතු රක්ෂණ ක්‍රමය යටතේ මුදල් ගෙවීම සම්බන්ධ විමසීම් සඳහා | 011 2398788 | dred@cbsl.lk |
| ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී ආයතනය | හිමිකම් නොලැබූ තැන්පතු සම්බන්ධ කරුණු විමසීම සඳහා | 011 7534800 | info@sfs.lk |

**අධ්‍යක්ෂ**
**බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දු.අ. 0094 11 2477504 ෆැක්ස්: 0094 11 2477738 ඊ මේල්:** dsnbfi@cbsl.lk

## ප්‍රසම්පාදන (ටෙන්ඩර්) දැන්වීම - 2023
## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

### (නාත්තන්ඩිය, මාරවිල, මහවැව සති පොළ බදු දීම)

1. නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව සතු නාත්තන්ඩිය, මාරවිල, මහවැව යන සති පොළ 2023.04.01 දින සිට 2023.12.31 දින දක්වා වූ කාලයට බදු දීම සඳහා මා විසින් ලංසු කැඳවනු ලැබේ.
2. එම දේපළ බදු ගැනීම සඳහා ආපසු ගෙවනු ලබන ලංසු ඇප තැන්පත් මුදල් හා ආපසු නොගෙවන ප්‍රසම්පාදන අයදුම්පත්‍ර ගාස්තු ගෙවීමෙන් පසු, බදු ලබා දෙන දේපළ ලැයිස්තුව, **ලංසු අයදුම්පත් හා ප්‍රසම්පාදන කොන්දේසි 2023.02.23 දින සිට 2023.03.13 දින දක්වා පෙ.ව 09.00 සිට ප.ව. 03.00** වන තෙක් නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක.
3. **2023.03.14 දින පෙ.ව. 09.30** දක්වා ප්‍රසම්පාදන අයදුම්පත් භාර ගන්නා අතර එදින ම පෙ.ව. **10.00 ට ලංසු විවෘත කිරීම** නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී සිදු කෙරේ. එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට සහභාගී විය හැක.
4. ලංසු අයදුම්පත් **"ලේකම්, ප්‍රාදේශීය සභාව නාත්තන්ඩිය"** යන ලිපිනයට ලංසු භාරගන්නා අවසන් වේලාවට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හැකිය.
5. ලංසු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී ලිපි කවරයේ වම් පස උඩ කෙළවරේ **"2023 වර්ෂයට ලංසු ඉදිරිපත් කිරීම යනුවෙන් සහ අයදුම්පත්‍රය ඉදිරිපත් කර ඇති දේපළෙහි නම සඳහන් කළ යුතු ය."** එක් එක් දේපළ බදු ගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් ලංසු අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
6. අසාධුගත ලේඛනයේ නම ඇතුළත් බදුකරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන් වෙත ප්‍රසම්පාදන අයදුම්පත් නිකුත් කරනු නොලැබේ. තවද ඕනෑම ලංසුවක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.
7. අවම ලංසුවට අඩුවෙන් ලංසු ඉදිරිපත් කරන ප්‍රසම්පාදන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, ඔවුන්ගේ හා අයදුම්පත් ලබාගෙන ලංසු ඉදිරිපත් නොකරන අයගේ ඇප මුදල් සභාව සතු කරනු ලැබේ.
8. වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙතින් ලබා ගත හැකිය.

නීතීඥ රොෂාන් නිලන්ත ප්‍රනාන්දු
සභාපති
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2023.02.17 දින,
ප්‍රාදේශීය සභා කාර්යාලය,
නාත්තන්ඩිය.
දුරකථන අංකය : 0322254276
Emall - naththandiyaps@yahoo.com
Fax - 032-2254275

## රාජ්‍ය සේවයේ සහ රාජ්‍ය සංස්ථාවල තනතුරු සඳහා පත් කෙරෙන/නම් කෙරෙන පුද්ගලයන්ගේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම පිළිබඳ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාව මඟින් මෙහි පහත දක්වා ඇති තනතුරු සඳහා නම්කර/පත්කර ඇති අයගේ යෝග්‍යතාවය පරීක්‍ෂා කර බැලීමට නියමිතය :-

| | නම සහ ලිපිනය | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය චානක හර්ෂ තල්පහේවා මහතා 380/56, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. | පිලිපීන ජනරජයේ ශ්‍රී ලංකා තානාපති වශයෙන් නම් කරන ලද |
| 2 | එම්.එස්.ජී. පීරිස් මහතා අංක 21, ලියනගේ මාවත, විජිතපුර, පැලවත්ත, බත්තරමුල්ල. | සීමාසහිත ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ සභාපති වශයෙන් සහ සීමාසහිත ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලද |
| 3 | තුසිර මැලැව්වේ තන්ත්‍රී මහතා අංක 27/8, පාක් ලේන්, රාජගිරිය. | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගමේ සභාපති වශයෙන් පත් කරන ලද |

ඉහත නම්කිරීම්/පත්කිරීම් සම්බන්ධයෙන් කරුණු දැක්වීමට කවර හෝ සංවිධානයක් හෝ පුද්ගලයකු කැමැත්තේ නම්, යථා පරිදි අත්සන් කරන ලද ලිඛිත සංදේශ **2023 මාර්තු මස 07** වැනි දින හෝ ඊට පෙර **"ලේකම්, උසස් නිලතල පිළිබඳ කාරක සභාව, කාරක සභා කාර්යාංශය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් එසේ කළ හැකිය. එසේ නැතහොත්, ෆැක්ස් අංක 011 - 2777389 වෙත ෆැක්ස් මගින් හෝ highposts_c@parliament.lk යන ලිපිනයට විද්‍යුත් තැපෑලෙන් ද එවිය හැක.

එකී ලිඛිත සංදේශවලට අමතරව වාචික සාක්ෂි ඉදිරිපත් කරන ලෙසට ද කාරක සභාව විසින් නියම කළ හැකිය. මෙම දැන්වීම පාර්ලිමේන්තු වෙබ් අඩවියේ ද ඇතුළත් කර ඇත. (www.parliament.lk)

**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**
**2023 පෙබරවාරි 22 වැනිදා**

**කාරක සභාවේ ලේකම්**
**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**




## ශ්‍රී ජිනරතන කාර්මික විද්‍යාලය, ගංගාරාමය
රජයේ පිළිගත් පාඨමාලා
(ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත)

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අංකය: P01/0786

නවලොව දිනන විශිෂ්ටයකු වන්න. නොපමාව පැමිණ අප හා එක්වන්න!

### Online & Physical

- **Information & Communication Technology Technician (ICT) - NVQ 4**
  *Full Time & Part Time (6 Months)*
- **Web Design**
  *Sundays - 8.30 a.m. - 12.30 p.m. (6 Months)*
- **Graphic Design**
  *Sundays - 1.00 p.m. - 5.00 p.m. (6 Months)*
- **MS Office**
  *Saturdays - 9.00 a.m. - 1.00 p.m. (3 Months)*
  *Sundays - 9.00 a.m. - 1.00 p.m. (3 Months)*
- **දෙමළ භාෂා පාඨමාලාව**
  *Saturdays - 1.00 p.m. - 4.00 p.m. (4 Months)*
  *Sundays - 10.00 a.m. - 1.00 p.m. (4 Months)*
- **කොරියානු භාෂා පාඨමාලාව**
  *Saturdays - 9.00 a.m. - 3.00 p.m. (6 Months)*
  *Monday & Wednesday - 9.00 a.m. - 1.00 p.m. (6 Months)*
- **ජංගම දුරකථන අළුත්වැඩියා පාඨමාලාව**
  *Saturdays - 9.00 a.m. - 1.00 p.m. (3 Months)*
  *Sundays - 9.00 a.m. - 1.00 p.m. (3 Months)*
  *Weekdays - Fulltime - 9.00 a.m. - 3.00 p.m. (12 Days)*
- **ජ්‍යොතිෂය පාඨමාලාව**
  *Saturdays - 9.00 a.m. - 1.00 p.m. (6 Months)*
  *Sundays - 9.00 a.m. - 1.00 p.m. (6 Months)*

**පෙබරවාරි 22 දක්වා ලියා පදිංචිය සිදුකෙරේ.**

**142, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02**
**0719451818/0742111818/0112386638/0112440073**
**ශාඛා:- විශ්වකලා හන්දිය, පිළියන්දල**
**අංක: 2-සී, සංඝරාජ මාවත (ලක්සැල ගොඩනැගිල්ල) මහනුවර**
**0773478600/0812227507/0710226200**

pressreader PRINTED AND DISTRIBUTED BY PRESSREADER PressReader.com +1 604 278 4604 COPYRIGHT AND PROTECTED BY APPLICABLE LAW

